# හද විදවන මතක සුවඳ



16

"පුතා ගන්න බ්‍රශ් එක. ලේස්ති වෙන්න දත් මදින්න. මම ටූත්පේස්ට් එකේ පෙණ නගින හැටි හොයා ගත්තා."

"තාත්තේ මම දත් මැදලා මූණ සෝදගෙන නේ මේ ඉන්නේ."

"කමක් නෑ පුතා ගන්න කෝ බ්‍රශ් එක."

තාත්තා කුඩා බෙලෙක් පෙට්ටියක දමාගෙන ආ ටූත්පේස්ට් ටිකක් ඇඟිල්ලට ගෙන මගේ දත් බුරුසුවේ තැවරී ය. මම දත් මැදීමට පටන් ගතිමි. විකසිත දෑසින් මදෙස බලා සිටී.

"පෙණත් ආවා. මින්ට් රසත් ආවා. ඒ උනාට ඉටිපන්දම් රහකුත් ආවා. ඉටිපන්දම් කෑලිත් විකුණා." මම දන්තාලේපය රහ ගුණ කීමි.

"ෂා ඇත්තද පුතා ? ඉටිපන්දම් රහ ආවද ? මම ඉටිපන්දම් අඹරලා කුඩු දැම්මා. ඒක හොඳට පිටි වෙන්න ඇඹරිලා නෑ. කොහොම උනත් ඒ වැඩේ හරි නෑ."

තාත්තා කියන්නේ පසුතැවිලි වන හඬකින් ය.

මිනිස්සු වයසට යනවිට පොඩි ළමයින් මෙන් ක්‍රියා කරතියි යන කියමනක් තිබේ. කෙතරම් වැඩිහිටියෙකු වුවද මේ හැඩිදැඩි තාත්තාටත් එම ධර්ම පොදු නොවේ ද?

"තාත්තා වෙන ක්‍රමයක් හොයලා බලන්න, හොයා ගන්න බැරිවෙන එකක් නෑ."

මම තාත්තාගේ හිත සැනසීමි.

තවත් හිමිදිරි උදෑසනක කව්දෝ මගේ කාමරයේ ජනේලයට ගැසුවේ වේලාව හයවීමටත් ප්‍රථමයෙනි. ජනේලයට උඩින් ඇති මල් ලෑල්ලෙන් පෙනුණේ පිටත තවමත් පවතින අඳුර ය. ආලින්දයේ දොර තවමත් වසා ඇති නිසා මම ජනේලය විවෘතකර බැලීමි. ඒ තාත්තා ය.

"පුතා, අද මට පුදුම සතුටු දවසක්. පුදුම සතුටු දවසක්. පුතා එක්ක මේ සතුට බෙදා ගන්න එළිවෙන්නේ කොයි වෙලාවෙද කියලායි මම මේ බලාගෙන හිටියේ. මට ඊයේ රෑ නින්ද ගියේ නෑ."

ගෙට ගොඩ වී මා වැලඳගත් තාත්තා පවසන්නට විය.

මම ඊයෙ රෑ තංගල්ලේ විජිතලයි ගෙදර ගියා. (විජිත රණවීර) මම ඉස්තෝප්පුවේ වාඩිවෙලා තේ එකක් බිබී ඉන්න කොට ගේ ඇතුළේ ඉඳලා කවුද කෙනෙක් මම ළඟට ඇවිල්ලා, "තාත්තට මම අඳුනන්න පුළුවන්ද" කියලා අහුවා. බැලින්නම් රෝහණ පුතා. මට සතුට වාවන්න බැරුව "අනේ මගේ පුතේ" කියලා රෝහණ පුතා බදා ගත්තා. රැවුල කපලා රෝහණ පුතා හරි ලස්සනයි. මෙලෝ කෙනෙකුට අඳුනන්න බෑ. පුතත් මේ ගැන කටේ කෙළ බිම හලන්න එපා."

භීෂණය උග්‍රවෙද්දී මම ගමින් පිටව වෙනත් ප්‍රදේශයක පදිංචිව රහසිගතව ජීවත් වුණෙමි. තාත්තලා ගෙය වසා දමා කොළඹ ප්‍රදේශයක තාවකාලික පදිංචියට ගියේ මා ගමහැර යන්නටත් පෙරිනි.

රෝහණ සහෝදරයා ඝාතනය වූ පුවත අසා මේ තාත්තාගේත්, අම්මා-ගේත් මුහුණුවල කොතරම් ගැඹුරු ශෝකයක් වේදනාවක් ඇඳී යන්ට ඇද්දැයි මම අද පවා චිත්තරූප මවන්නෙමි.

තවත් හිමිදිරි උදෑසනක කව්දෝ මගේ කාමරයේ ජනේලයට ගැසුවේ වේලව හයවීමටත් ප්‍රථමයෙනි. ජනේලයට උඩින් ඇති මල් ලෑල්ලෙන් පෙනුණේ පිටත තවමත් පවතින අඳුර ය. ආලින්දයේ දොර තවමත් වසා ඇති නිසා මම ජනේලය විවෘතකර බැලීමි. ඒ තාත්තා ය.

"පුතා, අද මට පුදුම සතුටු දවසක්. පුදුම සතුටු දවසක්. පුතා එක්ක මේ සතුට බෙදා ගන්න එළිවෙන්නේ කොයි වෙලාවෙද කියලායි මම මේ බලාගෙන හිටියේ. මට ඊයේ රෑ නින්ද ගියේ නෑ."

රටින් බැහැරව වසර 10 කට පසු නැවත රටට ගිය අවස්ථාවේ මං තාත්තාත් අම්මාත් ගැන සොයා බැලුවත් ඔවුහු නැවත ගමේ පදිංචියට පැමිණ තිබුණේ නැත.

එයින් වසර දෙකකට පසු නැවතත් ලංකාවට ගිය වතාවේ මට අසන්නට ලැබුණේ හදවත කකියවන දුක්මුසු පුවතකි. එනම් 'ඩැනියල් සිල්වා' නම් වූ තාත්තාත්, 'බැසිලින් ඉස්කෝලේ හාමිවේ' නම් වූ අම්මාත ජීවිතයෙන් සමුගෙන ඇති බවය.

ඔවුන් දෙදෙනා අයත් වූ පරම්පරාවේ බොහෝ දෙනෙකුට නොතිබුණු ඉදිරි දැක්මක්, සමාජවාදී සමාජයක් ගැන අකලංක විශ්වාසයක් තිබූ මේ අම්මාත් තාත්තාත් ජ.වි.පෙ. ඉතිහාසය තුළ නොමැකෙන ලෙස සටහන් විය යුතු උදාර චරිතයෝ නොවේද ?.

සමාජවාදීසමාජ ක්‍රමයක, සමාජවාදී ආර්ථික ක්‍රමයක අවශ්‍යතාව සැබෑවටම හිමිවිය යුතු මිනිසුන් (ජනතාව) එහි ප්‍රතිලාභ අත්විඳිය යුතු මිනිසුන් බොහෝ විට කරන්නේ රටේ ධනපති රොත්තක් තෝරා ඔවුන්ට දේශපාලන බලය ද, සුරසැප පරයන වරප්‍රසාද ද ලැබෙන සේ රටේ පාලකයන් වශයෙන් පත්කර තමන් දුකම අනුභව කිරීම ය. සමාජවාදය අවශ්‍ය මිනිස්සුන්ට සමාජවාදය උදාකර දීම සඳහා බොහෝ විට ඇපකැප වෙන්නේ සමාජවාදී පාලන ක්‍රමයක් තිබුණත් නැතත් ජීවත්විය හැකි පරිත්‍යාගශීලී මිනිසුන් ය.

තල් අරඹේ තිසර පෙරේරා සහෝදරයා එවැන්නෙකැයි මම සිතමි. ඔහුගේ පියා ගමේ පොහොසතෙකි. ඉඩකඩම් හිමියෙකි. ගම්මුන් ඔහු හැඳින්වූයේ 'ගාල්ලේ මහත්තයා' යන නමිනි. ගාල්ලේ මහත්තයා මහ කළු සිංහලයෙකු මෙන් කළු උස මහත හැඩි දැඩියෙකි. ඔහු මාතර රාහුල විද්‍යාලයේ ක්‍රිකට් පුහුණුකරු වශයෙන්ද කටයුතු කළේය. ගාලු මාතර පාරට මායිම් වූ වත්තක් මැද වූ පෙරේරා සහෝදරයාගේ මහ ගෙදර පැරණි වලව් පන්නයේ නිවසක් විය. පෙරේරා සොයුරා විසුවේ පියාගේ ගෙදර නොව වෙනම ය. වාහනයක් යා හැකි මැටි පාරක් දිගේ ගම ඇතුළත මඳ දුරක් ගිය විට එම ගෙදරට ළඟාවිය හැකිවිය. එම නිවසද පොල් වත්තක් මධ්‍යයේ වූ ඇමරිකන් පන්නයට ඉදිකළ ලොකු නිවසකි. ගාලු - මාතර පාරට යාබද වූ තවත් ඉඩමක පෙරේරා සහෝදරයා නව නිවසක් ඉදිකරමින් සිටියේය. ඔහු දියණියන් දෙදෙනෙකුගේ සහ පුතෙකුගේ පියෙකු විය. අප එහි යන කළ එම දරුවන් තිදෙනාම වයස අවුරුදු 12ට අඩු දරුවන් වූහ. පෙරේරා සොයුරු යටියන උළු කම්හලේ කළමණාකරුවකු ලෙස හොඳ රැකියාවක නියුතු විය. කඩවසම්, ප්‍රියමනාප මිනිසකු වූ ඔහු ගමන් බිමන් ගියේ තමා-ගේම වූ මෝටර් බයිසිකලයෙනි.

තල් අරඹේ, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල පාක්ෂිකයෙකු වූ ගාල්ලේ මහත්තයාගේ පුතා වූ තිසර, ජනතා විමුක්ති පෙරමුණට බැහැලාම වැඩ කිරීම ගමේ මිනිසුන්ට මුලදී පුදුමයට හේතුවක් වන්නට ඇතත් එය හොඳ ආදර්ශයක් ද විය.

1982 ජනාධිපති ඡන්දය ලං වූ කල ගෙයක් ගෙයක් ගානේ යන කැන්වසින් ව්‍යාපාරයේදී මගේ සහභාගීත්වය පෙරේරා සහෝදරයාට අත්‍යවශයම විය. එයට හේතුව වූයේ මගේ පියාගේ ගම තල්අරඹ වූයෙන් මට එහි විශාල ඥාති පරපුරක් සිටීම ය. එවිට ද මගේම ලොකු අයියා පදිංචිව සිටියේ ද තල්අරඹේ ය. ඔහු ප්‍රබල සමසමාජ පාක්ෂිකයෙකු විය.

දින පහක් පුරා පැවැත්වීමට පෙරේරා සොයුරු සංවිධානය කළ කැන්වසින් ව්‍යාපාරයට මම දිනපතාම සහභා-ගි වූයෙමි. ගමේ ගෙන් ගෙට ඇවිදින මෙම කාර්යායට පෙරේරා සොයුරුගේ බිරිඳ වූ 'නන්දක්කා' ද සහභාගී විය. ඇය පක්ෂයේ සොයුරියන් පිරිවරාගෙන ගමේ ඇවිද්දේ කාන්තා නායිකාව මෙනි.

ජනාධිපති ඡන්දයට ඔන්න මෙන්න කියා තිබියදී සිදුවූ දේශපාලන කෝලහලයක් සම්බන්ධයෙන් මටත් සගයින් කිහිප දෙනෙකුටත් බරපතළ චෝදනා නගා අප හිරගෙදර කොටු කර තැබීමට වැලිගම පොලීසිය උත්සාහ දැරුවේ ඇමතිවරයාගේ උසිගැන්වීමකි. අපි වසන් වීමු. එවිට වැලිගම පොලීසිය කරන ලද්දේ තල්අරඹේ ජ.වි.පෙ. මැතිවරණ කාර්යාලයේ සිටි තිදෙනෙකු අත්අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කර රිමාන්ඩ් කරවීම ය. මින් එක් තැනැත්තකු වූයේ පෙරේරා සොයුරුගේ මස්සිනා ය. හෙවත් ඔහුගේ බිරිඳගේ අයියා ය. ඉන්ද්‍රසිරි, ලාල්, සරත් (පූසා) යන සොයුරන් තිදෙනා සමඟ මා උසාවියට භාර වූයේ අප ඉදිරිපත් වෙනතුරු තල් අරඹේ සොයුරන් තිදෙනාට ද ඇප නොලැබෙන බව පැවසුණ හෙයිනි. එහෙත් අප භාර වුවද ඔවුන්ට ඇප නොලැබිණ. අප හත් දෙනාම මාස දෙකකට අධික කාලයක් ඇලුමිනියම් තැටියට ලැබෙන කල්දේරම් බත වළඳා සීතල සිමෙන්ති පොළවේ අතුරන ලද ගෝනි පඩංගුවල වැතිරී නිදා ගත්තෙමු. තරමක් අසීරු විඳගැනීමක් වුණත් අප හිතුවාට වඩා හොඳින් අනන්ද අයියා, එනම් පෙරේරා සොයුරුගේ මස්සිනා මෙම තත්වය දරා ගත්තේ ය.

ජ.වි.පෙ. තහනම් කිරීමෙන් පසු මට පෙරිරා සහෝදරයා හමුවූයේ එකම එක වරකි. එම කෙටි හමුවීමේදී ද ඔහු පක්ෂය ගැනත් රෝහණ සහෝදරයා ගැනත් නොසිඳුණු ඇල්මකින් හා ශක්තියකින් කථා කළේ ය.

1989 නොවැම්බර් 14 දින මා අත්අඩංගුවය පත් වූ දින පටන් එළඹුණ සෑම දිනක්ම එකසේ බිහසුණු විය. මගේ මතය එම දිනය නොවැම්බර් 15 ත් 20ත් අතර දිනයක් බව ය. වැලිගම නිව් රෙස්ට් හවුස් හමුදා කඳවුරේ අප ගාල් කර සිටි කැන්වස් කූඩාරමට රාත්‍රී 9 හෝ 10 ට පමණ කඩා වැදුණු හමුදා නිලධාරියෙකු "තල්අරඹේ තිසර පෙරේරාගේ දන්න එවුන් ඉන්නවනම් අත උසස්පියව්" කියමින් ගෝරනාඩු කළේ ය. මගේ සිරුරේ අභ්‍යන්තරය ගින්නකින් මෙන් දැවී ගියේ ය. "පෙරේරා සහෝදරයාත් අල්ලන්නයි හදන්නෙ. අහෝ පාර චෛන්ද්‍රක බලය (ටෙලිපති) මෙන් බලයකින් හෝ මේ අනතුර ගැන ඔහුට දැන්වීමට ඇත්නම්" මට සිතිනි. පෙරේරාගේ නිවස දන්නා කිසිවකු ඉදිරිපත් වූ බවක් නොහැඟිණ. "හිටපියව් තොපිට කෙළවල ගන්න" යයි පැවසූ හමුදා නිළධාරියා පිටව ගියේය" මට හිතුණේ එම රාත්‍රියේදීම පෙරේරා සොයුරුද එම අපායට ගෙනැවිත් දමණු ඇතැයි කියාය. ඉන් දින හතරක් පහක් යනතුරු දෙනෙත වසා බඳින ලද රෙදිකඩ ලිහන අවස්ථා වල මා පරිස්සමින් වටපිට බැලුවේ ඔහු මේ පිරිස අතර සිටීදැයි දැනගැනීමටය.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ

*ප්‍රංශයේ සිට*